01) අතීතයේ සිට වර්තමානය දක්වාම ශ්‍රී ලංකාව කෘෂි කාර්මික රටක් ලෙස ප්‍රචලිතය.

1. ශ්‍රී ලංකාවේ අතීතයේ සිට කෘෂිකර්මාන්තය පැවති බවට ඇති සාක්ෂි තුනක් ලියන්න.
2. (අ) වැව් බැඳි රාජ්‍ය ලෙස හඳුන්වන්නේ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයද ?
   (ආ) වැවක දැකිය හැකි කොටස් තුනක් නම් කර ඉන් කෙරෙන කාර්යය බැගින් ලියන්න.
3. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා ඇති විභවයන් තුනක් නම් කරන්න.

02) මනා පාංශු ව්‍යුහයක් සහිත පසක ප්‍රශස්ථ මට්ටමින් ජලය හා වාතය රඳවා ගනියි.

1. (අ) පාංශු ව්‍යුහය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?
   (ආ) පාංශු ව්‍යුහය පවතින ප්‍රධාන ආකාර කවරේද ?
2. (අ) පාංශු ජලය පවතින ආකාර මොනවාද ?
   (ආ) මින් ශාකවලට ලබාගත හැකි ජල වර්ගය කුමක්ද ?
3. (අ) පසක් ආම්ලික වීමට බලපාන හේතු දෙකක් ලියන්න.
   (ආ) ආම්ලිකතාවය උදාසීන කිරීමට පසට යෙදිය හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.